# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අධ්‍යාපන පීඨය

## පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (පූර්ණ කාලීන)
## පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2016

## CU 501 - අධ්‍යාපනයේ දාර්ශනික හා සමාජ විද්‍යාත්මක පදනම

**පැය තුනයි (03)**

**පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (5) පිළිතුරු සපයන්න.**

---

'අ' කොටසින් පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක් ද, 'ආ' කොටසින් හයවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න දෙකක්ද වශයෙන් ප්‍රශ්න හයකට (6) පිළිතුරු සපයන්න.

උපදෙස්:

- එක් එක් කොටසට අදාළ පිළිතුරු වෙන වෙනම පොත්වල ලියා වෙන වෙනම අමුණා බාර දෙන්න.
- ඒ ඒ පිළිතුරු පොත්වල මුල් පිටුවේ දකුණු කෙළවරේ කුමන කොටසද යන්න විෂය නම සමඟ සඳහන් කරන්න.
- 1 සහ 6 වන ප්‍රශ්නවලට ලකුණු 20 බැගින්ද, අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 15 බැගින් ද වෙන් කර ඇත.

### අ කොටස - දාර්ශනික පදනම

1. i. අධ්‍යාපන සංකල්පය සම්බන්ධයෙන් ලබා දී ඇති නිර්වචනවල දක්නට ඇති විවිධත්වය කෙරෙහි බලපාන සාධක හතරක් (04) ලියන්න.

(ලකුණු 04)

ii. "දර්ශනය අධ්‍යාපනය මත යැපේ" මෙය සනාථ කිරීම සඳහා යෝග්‍ය හේතුන් දෙකක් (02) ලියන්න.

(ලකුණු 04)

iii. උපයෝගිතාවාදීන් පෙන්වාදෙන පරිදි ව්‍යාපෘති ක්‍රමය යනු කුමක්දැයි අර්ථ දක්වා එහි මූලික අදියර හතර (04) නම් කරන්න.

(ලකුණු 04)

iv. විඥානවාදීන්ට අනුව ලෝකයේ පැවැත්ම වටිනාකම් මත (Values) රඳා පවතී. මෙහි වටිනාකම් යනු කුමක්දැයි අර්ථ දක්වන්න.

(ලකුණු 04)

v. තෝමස් ලිකෝනා ඉදිරිපත් කළ එදායි චරිතායන අධ්‍යාපන මූලධර්ම දෙකක් ලියන්න.

(ලකුණු 04)

2. i. විඥානවාදී (Idealism) දාර්ශනික චින්තනයේ මූලික දාර්ශනික අදහස් සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii. විඥානවාදීන් අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරිපත් කාල අදහස් වත්මන් විෂයමාලාව තුළට අතුළත් කිරීමේ ඇති වැදගත්කම පෙන්වා දෙන්න.

(ලකුණු 08)

3. i. "අධ්‍යාපනය සැබෑ ලෙසම ක්‍රියාවට නැංවීම සඳහා සෑම ගුරුවරයකුටම මනා දාර්ශනික අවබෝධයක් තිබිය යුතුය" මෙම අදහසෙහි සත්‍යතාව පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

(ලකුණු 07)

ii. අධ්‍යාපන දර්ශනය යන්න අර්ථ දක්වා එහි කාර්යයන් මොනවාදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 08)

4. i. "ඉගැන්වීම (Teaching) සම්බන්ධයෙන් පවතින සාම්ප්‍රදායික (Traditional Paradigm) සහ නූතන අදහස පිළිබඳ (New Paradigm) තුලනාත්මක අධ්‍යයනක් කරන්න. (ලකුණු 07)

ii. දැනුම් සමාජය, (knowledge Society) එකට ජීවත්වීමට ඉගෙනීම (Learning to live together) යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

5. i. මහත්මා ගාන්ධිතුමාගේ දර්ශනය හා අධ්‍යාපනික අදහස් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii. මහත්මා ගාන්ධිතුමාගේ චින්තනය විසි එක් වන සියවසට අදාළ කරගත හැකි ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

<u>ආ කොටස - අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම</u>

6. පහත සඳහන් කොටස්වලට කෙටි නිශ්චිත පිළිතුරු සපයන්න.

i. පාසලක අවිධිමත් සමූහ සබඳතා යථාර්ථවාදීව හඳුනා ගැනීමට ඇති ක්‍රම දක්වන්න.

ii. සමාජ ස්තරායනය පිළිබඳ කෘත්‍යවාදී න්‍යාය හා සම්මතවාදී න්‍යාය අතර වෙනස දක්වන්න.

iii. සමාජ සචලනය ගණනය කරන ක්‍රම දෙකක් හඳුන්වාන්න.

iv. සමාජ වෙනස්වීම් පිළිබඳ මතවාද දෙකක් නම් කරන්න.

v. සමාජමිතික ප්‍රස්ථාරයන්ගෙන් හඳුනාගත හැකි සමාජ සම්බන්ධතා නම් කරන්න.

(ලකුණු 4x5= 20)

7. i. සමාජයක සංස්කෘතිය කාලීන වශයෙන් පරිවර්තනයකට බලපාන සාධක නිදසුන් දක්වමින් විග්‍රහ කරන්න. (ලකුණු 07)

ii. පාසල මගින් සංස්කෘතිය පවරාදෙන ආකාරය හා එයට ගුරුවරයා දායක විය යුතු අන්දම පැහැදිලි කරන්න.

(ලකුණු 08)

8. i. අධ්‍යාපන ක්‍රියාවලියට සමාජස්තර විවිධ අන්දමින් සම්බන්ධ වන ආකාරය පර්යේෂණ නිගමන ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ii. අධ්‍යාපනය හා සමාජ සචලනය අතර සම්බන්ධය හඳුන්වා, අධ්‍යාපනයෙන් සමාජ සචලනය සිදුවන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 08)

9. i. ගුරු භූමිකාවේ ස්වභාවය තීරණය වන සමාජීය සාධක විස්තර කරන්න.

(ලකුණු 07)

ii. ගුරු භූමිකාවේ ගැටුම්වලට හේතු හා ගැටුම් වර්ග හඳුන්වා ඒවාට ගැලපෙන විසඳුම් ඉදිරිපත් කරන්න.

(ලකුණු 08)

10. i. පවුලේ ස්වභාවය සමාජානුයෝජනයට දායක වන ආකාරය පෙන්වා දී වර්තමානයේ ඒ පිළිබඳ පවතින අභියෝග හඳුන්වන්න.

(ලකුණු 07)

ii. ජනමාධ්‍ය ශිෂ්‍ය සමාජානුයෝජනයට විවිධාකාරයෙන් බලපාන අන්දම නිදසුන් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 08)

○○○○○○○○○○○○○